**සූරියවැව ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සූරියවැව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සූරියවැව බස් නැවතුම්පොල 08 ජේළිය කඩ කාමර 08 සඳහා 2016 ජුනි මස සිට 2022 මැයි මස දක්වා බිල් නොකළ කඩ කාමර කුලී රු. 1,526,400 ක් සමාලෝචිත වර්ෂය තුල ආදායමක් සහ ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | කඩ කාමර වල අයිතිය නීත්‍යානුකූලව ලැබෙන තෙක් බිල් නොකරන ලෙස සභා අනුමැතිය ලද බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.206,250 ක ස්ථාවර තැන්පත් පොලිය ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මෙවැනි දෝෂ සිදු නොවන පරිදි කටයුතු කරන බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 2,487,706 ක වැටුප් ප්‍රතිපූර්ණයවීම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයකදී ලබාදී තිබූ රු. 700,000 ක මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ජංගම වගකීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන (2021) යටතේ ගිවිසුම්ගත වී වැඩ අවසන් නොකරන ලද කර්මාන්ත 05 ක් සඳහා රු. 10,000,000 ක වටිනාකමින් සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියන් හා ණයගැතියන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව | ගිවිසුම්ගත වී වැඩ අවසන් කළ කර්මාන්ත සඳහා පමණක් ණයගැති/ ණයහිමි ප්‍රතිපාදන වෙන් කළ යුතුය. |
| (ඊ) | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන (2021) යටතේ ක්‍රියාත්මක කර තිබූ ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති 16 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත ණයහිමියන් හා ණයගැතියන් රු. 913,907 ක් වැඩියෙන් දක්වා තිබුණි | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ණයගැති/ ණයහිමි ප්‍රතිපාදන නිවැරිදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය සඳහා ලද රු. 463,088 ක වැටුප් ප්‍රතිපූර්ණ, ආදායම් අධාර යටතේ ගිණුම්ගත නොකර විවිධ තැන්පත් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | සභා අරමුදලින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කළ රු. 2,466,547 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 03 ක වටිනාකම ප්‍රාග්ධන ආදායම් හා ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත නොකර අයභාර ආදායම් හා අයභාර වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | අඩු ආදායම් ලාභීන් සඳහා ජංගම වෙළඳ කුටි 35 ක් ඉදිකිරීමේ කර්මාන්තය ඉටු නොකිරීම මත කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කර තිබියදී එම කර්මාන්තය වෙනුවෙන් රු. 4,549,650 ක කර්මාන්ත ණයගැතියන් හා ණයහිමියන් සමාලෝචිත වර්ෂය අවසානයටද ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ගිවිසුම් අවලංගු කළ කර්මාන්ත සඳහා ණයගැති/ ණයහිමි ප්‍රතිපාදන වෙන් නොකළ යුතුය. |
| (ඒ) | ඉකුත් හා සමාලෝචිත වර්ෂයේදී විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම මත ප්‍රතිපූර්ණය නොවන වීථි පහන් නඩත්තු ගාස්තු රු. 469,824 ක් ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ගිවිසුම්ගත නොවූ ආදායම් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත නොකළ යුතුය . |
| (ඔ) | කර්මාන්ත දෙකකට අදාළව ප්‍රාග්ධනිත කළ යුතු වටිනාකම රු. 501,689 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වත්කම් ප්‍රාග්ධනිත කිරීම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | සමලෝචිත වර්ෂය අවසානයට සහා අරමුදලින් මදුනාගල කසල අංගනය පිහිටි භූමියේ ගලි පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කර්මාන්තයට අදාළව ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කළ යුතු වටිනාකම රු. 350,300 ක් වැඩියෙන් හා රු. 327,742 ක් වැඩියෙන් ණයහිමි ප්‍රතිපාදනද වෙන්කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | වත්කම් ප්‍රාග්ධනිත කිරීම හා ණයහිමි ප්‍රතිපාදන වෙන්කිරීම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ක) | 1994 අංක 04 දරන දකුණු පළාතේ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය අනුව සභාවට නොලැබෙන 2019 හා 2020 වර්ෂයන්ට අදාළ රු. 317,050 ක මුද්දර ගාස්තු ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව. | ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | -------------------- | ----------------------------- | ----------------------- | ------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු තක්සේරු කර අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දේපල තක්සේරු කිරීමේ කාර්යය ඉටුකර ගැනීමට නොහැකි වූ නිසා වරිපනම් බදු අය නොකළ බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ දැල් වැට සකස් කිරීමට මිලදී ගත් බට අස්ථානගත වීම මත කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතු රු.60,900 ක අලාභය සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගෙන් ලැබිය යුතු මුදල අයකර ගැනීමට නොහැකි වූ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 18,326,764 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 17,815,568 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 2,163,000 | 1,273,390 | 3,381,060 | 160,170 | 2,103,000 | 3,309,350 | 1,148,270 | 2,267,840 |
| කුලී | 36,585,500 | 31,583,026 | 24,767,841 | 12,220,577 | 30,952,500 | 32,807,772 | 18,097,425 | 5,405,392 |
| බලපත්‍ර ගාස්තු | 1,440,600 | 1,427,004 | 2,115,154 | 886,775 | 1,338,500 | 2,032,178 | 1,144,078 | 1,574,925 |
| වෙනත් ආදායම් | 4,725,200 | 7,955,038 | 5,216,908 | 4,839,156 | 39,550,000 | 50,835,857 | 44,938,132 | 2,101,026 |
| එකතුව | **44,914,300** | **42,238,458** | **35,480,963** | **18,106,678** | **73,944,000** | **88,985,157** | **65,327,905** | **11,349,183** |

#### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 83 කින් ලැබිය යුතු ව්‍යාපාර බදු රු. 90,230 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 152 (1) වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂවල සිට අය නොවී පැවති රු. 69,940 ක ජල ගාස්තු ආදායම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට යොමු කළ බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර 65 කින් ලැබිය යුතු එකතුව රු. 1,090,997 ක කඩ කාමර කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම හිඟ හිටි ශේෂය තුළ වසර 03 ත් 05 ත් අතර සහ වසර 05 වැඩි හිඟ හිටි ශේෂය පිළිවෙලින් රු.22,400 ක් සහ රු. 489,150 ක් විය. | හිඟ කඩ කුලියෙන් රු.477,028 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ අතර ඉතිරි හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දින වන විටත් කඩ කාමර 11 ක් වෙනුවෙන් සභාවට ලැබිය යුතු රු. 472,671 ක එක්වන් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 270,991 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත්කළ අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| ( ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට, බදු දේපළ 17 කින් වෙළඳ අයිතිය බදු දීම මත ලැබිය යුතු රු. 10,988,000 ක මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොටසක් කපා හැරීමට අනුමැතියට ඉදිරිපත්කළ අතර ඉතිරියට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සහ හිඟ අයකර ගැනීමට හා ආරක්ෂිත ඇප මුදලින් හිලව් කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 193 කින් 2019 හා 2022 වර්ෂයත් අතර කාලය සඳහා ලැබිය යුතු බලපත්‍ර ගාස්තු එකතුව රු. 158,500 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දැන්වීම් පුවරු 50 කින් ලැබිය යුතු එකතුව රු. 719,900 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඌ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.1,789,744 ක් හා රු. 927,750 ක් විය. | හිඟ ශේෂයන් ගෙන්වා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පැවති LPL ක්‍රිකට් තරගාවලිය වෙනුවෙන් සභාවට අයවිය යුතු විනෝද බදු මුදල ගණනය කර අයකර ගැනීමට සභා කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. තවද අයකළ රු. 1,000,000 ක තැන්පතුව නිරවුල් කර නොතිබුණි. | තැන්පතුව ආදායමට ගැනීමට කටයුතු කරන බව. | විනෝද බදු මුදල අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සූරියවැව සතිපොල පොදු වැසිකිළිය අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය රු. 4,334,750 ක ගිවිසුම්ගතවී තිබුණද කොන්ත්‍රාත්කරු විසින් එකඟ වූ වැඩ වටිනාකමින් රු.994,581 ක් පමණක් නිමකර කර්මාන්තය අත්හැර දමා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම පරිදි කටයුතු නොකිරීම නිසා ඔහු විසින් ඉදිරිපත් කර තිබූ රු. 216,738 ක කාර්ය සාධන සුරක්ෂණය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | චෙක්පතකින් ලද කාර්ය සාධන සුරක්ෂණයේ වටිනාකම සභාවේ ගිණුමට බැර කර ගැනිමට කටයුතු කරන බව. | කාර්ය සාධන සුරක්ෂණ චෙක්පත්වලින් ලබාගත නොහැකි අතර නිවැරදි කාර්ය සාධන සුරක්ෂණයක් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත අඩු ආදායම් ලාභීන් සඳහා ජංගම වෙළඳ කුටි 35 ක් ඉදිකිරීම සඳහා රු. 4,549,650 කට කොන්ත්‍රාත්කරුවෙකුට පවරා තිබුණද කොන්ත්‍රාත්කරු විසින් එම කාර්යය ඉටු නොකර අත්හැර දැමීම නිසා සභා බල ප්‍රදේශයට ලැබිය හැකිව තිබූ ප්‍රතිලාභයක් අහිමි වී තිබුණි. කොන්ත්‍රාත්කරුගෙන් ලබාගත යුතු ලංසු සුරක්ෂණයේ වටිනාකම රු. 97,482 ක් අඩුවෙන් ලබාගෙන තිබීම නිසා සහා අරමුදලට එම ප්‍රමාණයෙන් පාඩුවක් සිදුව තිබුණි. | සාම්පල පරීක්ෂාව සඳහා වටිනාකම රු.129,000 ක් වූ ජංගම වෙළඳ කුටියක් සභාවට ලබා දී ඇති බව. | ලංසු සුරක්ෂණයේ වටිනාකම නිවැරදිව ලබාගත යුතුය. |
| (ඇ) | සභාව විසින් දෛනිකව රැස් කරනු ලබන කසළ, වෙන් කිරීමකින් තොරව අවිධිමත්ව බැහැර කර තිබූ අතර වසර කිහිපයකට පෙර ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ කොම්පෝස්ට් නිපදවීමේ කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන සමාලෝචිත වර්ෂයේදීත් ආරම්භ කර නොතිබුණි. | ප්‍රතිපාදන ලද පසු කසල අංගනය සකස් කර කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන ආරම්භ කිරීමට කටයුතු කරන බව. | කසළ ප්‍රතිචක්‍රීකරණය කළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනිවැල්ආරපොල භූමියේ ඇති කම්බි වැට හා ගේට්ටු අලුත්වැඩියා කිරීමට අදාළ කර්මාන්තය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇස්තමේන්තුවේ අනුව පොළ භූමියේ කැලය ඉවත් කිරීම සඳහා නියමිත රේටයක් යොදා නොගැනීමෙන් රු. 271,394 කින් සභා අරමුදලට පාඩුවක් සිදුව තිබුණි. | ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමේදී භාවිතා කරන රේටයන් හා එම රේටයන් සකස්කරන ආකාරය පිළිබඳව අවධානය යොමු කරන බව. | වැඩිපුර කළ ගෙවීම් සම්බන්ධයෙන් මු.රෙ. 156 අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | සභාව විසින් ක්‍රියාත්මක කර තිබූ වෙනිවැල්ආර පොළොහි කම්බි වැට හා ගේට්ටු අලුත්වැඩියා කිරීම , මුවන්පැලැස්ස පොදු ක්‍රීඩාංගනය සංවර්ධනය කිරිම හා ජීවනාලී ක්‍රීඩාංගනයේ දැල්වැට සැකසීම යන කර්මාන්ත තුනට අදාළව රු. 107,409 ක් අඩුවෙන් ප්‍රමාද ගාස්තු අයකර තිබුණි. | සියයට 10 රඳවුම් මුදලින් අඩු කර ගන්නා බව. | ප්‍රමාද ගාස්තු නිවැරදිව ගණනය කර අයකරගත යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාර සමීක්ෂණයෙන් හඳුනාගත් ව්‍යාපාර 157 ක් පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබූ අතර ඉන් ඉකුත් වර්ෂයන්හිදී ආරම්භ කළ ව්‍යාපාර 05 ක් 2022 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍රය ලබාගෙන තිබුණද පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම ව්‍යාපාර සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් සභාව විසින් සකස් කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගැනීම සඳහා ව්‍යාපාරිකයින් උනන්දු කරවීමට කටයුතු කරන බව. | ව්‍යාපාරිකයින් පරිසර බලපත්‍ර ලබා ගැනීමට උනන්දු කරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2020 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන ලිපියේ 06 ඡේදය ප්‍රකාරව නව වීථි පහන් ස්ථාපිත කිරීමේදී විදුලි බල මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට සවිකර තිබූ වීථි පහන් 2886 න් 531 ක් සඳහා පමණක් අනුමැතිය ලබාගෙන තිබීමෙන් අනුමැතිය නොලත් වීථි පහන් සංඛ්‍යාව 2355 ක් විය. තවද 2017 වර්ෂයෙන් පසුව වීථි පහන් සමීක්ෂණයක්ද සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ඉතිරි වීථි පහන් සඳහා අනුමැතිය ලබා ගැනීමට සහ සංගණන කටයුතු කඩිනමින් ඉටු කිරීමට කටයුතු කරන බව. | උපදෙස් ලිපිය පරිදී කටයුතු කිරීම සහ වීථි පහන් සමීක්ෂණයක් සිදු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු ඉඩම් 15 ක සුසාන භූමි 09 ක හා වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් හා සුසාන භූමිවල අයිතිය පවරා දෙනමෙන් අදාළ ආයතන වලට ලිපි යොමු කළ බවත්, එක් වාහනයක් පවරා ගත් බව හා ඉතිරි වාහනය පවරා ගැනීමට කටයුතු කරන බව. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුය. |

## 3.5 ව්‍යාපෘති, කර්තව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මදුනාගල කසල අංගනයේ මුරකුටිය අසල කැමරා පද්ධතියක් සවි කිරීමට 2021 දෙසැම්බර් 31 දින ගබඩාවට ලද භාණ්ඩ සඳහා 2022 ජනවාරි 22 දින රු. 355,950 ක් ගෙවීම් කර තිබුණද මුරකුටියේ වැඩ අවසන් නොකර හා විදුලිය ලබා නොගෙන එම වත්කම් විගණිත දින දක්වා ගබඩාවේ තබා තිබුණි. | මදුනාගල කසල අංගනය සඳහා නව විදුලි සම්බන්ධතාවය ලබා ගැනීමට නොහැකිවීම CCTV සවිකිරීම ප්‍රමාද වීමට හේතු වූ බව. | වත්කම් ඵලදායීව භාවිතයට ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ අයවැය ලේඛනයේ සභා අරමුදලින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ රු. 23,250,000 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 10 න් රු. 300,000 ක් වූ දිවා සුරැකුම් මධ්‍යස්ථානයට උපකරණ මිලදී ගැනීමේ ව්‍යාපෘතිය පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යෑම නිසා අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයන් ප්‍රමාණවත් නොවීම නිසා බව. | අයවැයගත සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 වගන්තියට අනුව කටයුතු නොකර මිලගණන් කැඳවූ ආයතන විසින් ලබාදුන් පිරිවිතර පදනම් කරගෙන සභාවේ ප්‍රසම්පාදන අවශ්‍යතාවය තීරණය කර එකතු වටිනාකම රු. 1,242,950 ක් වූ CCTV කැමරා 27 ක් 2022 අගෝස්තු 31 දින මිලදී ගෙන තිබුණි. තවද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් සභා කාර්යාල පරිශ්‍රයේ CCTV කැමරා පද්ධති ස්ථාපිත කිරීම වෙනුවෙන් ලද පිරිවිතර ඇගයීමේදී වැදගත් පිරිවිතර අයිතමයන් ඇගයීමට ලක් කර නොතිබුණි. | මිල ගණන් කැඳවීමේදී අවශ්‍ය ස්ථාන සඳහන් කර කැමරා අංක සහ කේබල් දිග ප්‍රමාණද සමඟ Indoor, Outdoor, night vision සඳහන් කරමින් පිරිවිතර සඳහන් කළ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2021 පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ සභා බල ප්‍රදේශයේ මාර්ග 04 ක මීටර් 2700 ක් දිගට ජලනල එළීම සඳහා රු. 1,982,292 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට 2022 වර්ෂයේදී ගෙවා තිබූ අතර ජලනල එළීම කර තිබූ දුර ප්‍රමාණය මීටර් 2101 ක් වුයෙන් රු. 438,930 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඉදිරියේදී සභාව ඉටු කරන ව්‍යාපෘති වෙනත් ආයතන සමග සම්බන්ධවී ඉටු කිරීමේදී වඩාත් සැළකිලිමත්ව කටයුතු කරන බව. | වැඩිපුර කළ ගෙවීම් සම්බනධයෙන් මු.රෙ. 156 අනුව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගංවතුරින් විපතට පත්වී ඇති ජනතාවට අවශ්‍ය සහන සැලසීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් (දකුණු) ලැබී තිබූ ප්‍රතිපාදන උපයෝගී කරගෙන 2021 වර්ෂයේදී රු. 302,076 ක් වැයකර මිලදීගෙන තිබූ මිලිමීටර් 610 ප්‍රමාණයේ හියුම් පයිප්ප 22 න් 07 ක් අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සභා කාර්යාල පරිශ්‍රයේ තබා තිබුණි. | මහජන ඉල්ලීම් හා එම පයිප්ප ස්ථානගත කිරීමට සුදුසු තැන් පරීක්ෂා කර කඩිනමින් ස්ථාන ගත කිරීමට කටයුතු කරන බව. | මිලදීගත් හියුම් පයිප්ප අපේක්ෂිත කාර්යය සඳහා යොදාගත යුතුය. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට (රා.ප.ච.25/2014 සේවකයන්ද ඇතුළත්ව) සභාවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 59 ක් සහ 73 ක් වූයෙන් අතිරික්තතා 20 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතිරික්තතා අනුමත කර දෙන මෙන් අදාළ බලධාරීන් දැනුවත් කළ බව. | අතිරික්තතා විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |